**වෙන්ගලාච්ඩිකුලම් ප්‍රාදේශීය සභාව**
**වවුනියා දිස්ත්‍රික්කය**
**---------------------------**

**1 මූල්‍ය ප්‍රකාශන**
**----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**---------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත්කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 අගෝස්තු 21 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට වෙන්ගලාච්ඩිකුලම් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**---------------------------------------**

**1.3.1 ලැබියයුතු සහ ගෙවියයුතු ගිණුම්**
**-----------------------------------**

**(අ) ලැබියයුතු ගිණුම්**
**------------------**

රු. 43,700 ක්වූ ලැබුනු ආයුර්වේද ආධාර මුදල් පසුගිය වසර 14 ක සිට සභාව විසින් ප්‍රයෝජනයට නොගෙන තිබුණද, එයට හේතු විගණනයට පැහැදිලි කර නොතිබුණි.

**(ආ) ගෙවියයුතු ගිණුම්**
**------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ඉකුත් වර්ෂය වෙනුවෙන් සැපයුම්කරුවන්ට ගෙවියයුතු රු. 174,673 ක මුදල ගෙවීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(ii) සේවය හැර ගිය සහ විශ්‍රාම ගිය නිලධාරීන් 06 දෙනෙකුට ගෙවියයුතු ඇප තැන්පත් රු. 20,000 ක මුදල වර්ෂ 05 කට වඩා වැඩි කාලයක් ආපසු නොගෙවා තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

**1.3.2 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**
**-----------------------------------------------------**

විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම
-----------------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 4,473,906 ක්වූ ගිණුම් විෂයයන් හයක් විගණනයේදී සතුටු දායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**1.3.3 අනුකූල නොවීම්**

**-------------------**

**නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

**--------------------------------------------------------------------------------**

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| --------------------------------------- | | ------------ | ------------------ |
| | | රු. | |
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | |
| | (i) රීති 217 | - | සභාව විසින් ප්‍රයෝජනයට ගනුලබන ඉඩම් සහ ගොඩනැගිලි සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| | (ii) රීති 153 | - | හිඟ ආදායම් ප්‍රකාශය ප්‍රාදේශීය සභා ආකෘතිය අනුව සකස්කර නොතිබුණි. |
| | (iii) රීති 60 | - | සභා බල ප්‍රදේශයේ තිබෙන කර්මාන්තවල් පිළිබඳ සමීක්ෂණයක් වර්ෂය ආරම්භයේදී පවත්වා නොතිබුණි. |
| | (iv) රීති 165 | - | ප්‍රධාන ලේඛනයේ වගකීම, ආදායම් සහ වියදම් සටහන් කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>------------------------------- | | |
| | (i) මුදල් රෙගුලාසි 1646 | - | වාහනවල ධාවන සටහන් සහ මාසික සාරාංශ ඊලග මාසයේ 15 වන දින ප්‍රථම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 571 | 34,420 | එකතුව රු. 34,420 ක්වූ කල් ඉකුත්වූ තැන්පත් 03 ක් සම්බන්ධයෙන් පසුගිය වර්ෂ එකේ සිට වර්ෂ තුනක කාලයතුල අවශ්‍ය කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති 30/2016 අංක දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | | වාහනවල ඉන්ධන දහනය පිළිබඳ පරික්ෂණ පසුගිය වර්ෂ එකකට වැඩි කාලයක්තුල සිදුකර නොතිබුණි. |

**2 මූල්‍ය සමාලෝචනය**

**-----------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

**--------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් රු. 4,202,522 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් රු. 12,955,022 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන් තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන් තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | කුලී | 8,076,210 | - | 8,454,332 | - | 9,361,840 | - | 9,235,531 | 126,309 |
| (ii) | බලපත්‍ර ගාස්තු | 976,550 | - | 789,325 | 187,225 | 621,000 | - | 706,966 | |
| (iii) | වෙනත් ආදායම් | 24,681,987 | - | 13,160,663 | 11,521,323 | 14,332,895 | - | 9,548,542 | 6,153,597 |

### 2.2.2 කුලී

රු. 28,750 ක්වූ හිඟ බදුකුලී සභාව විසින් පසුගිය වර්ෂ 21 සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

උතුරු පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබියයුතුව තිබූ උසාවි දඩ රු. 1,903,319 ක හා මුද්දර ගාස්තු රු. 2,655,937 ක් විය.

### 2.2.4 වෙනත් ආදායම්

සභාවට අයත් ජෙසීබී යන්ත්‍රය, මෝටර් ග්‍රේඩරය සහ මෝටර් රෝලරය කුලියට දීම වෙනුවෙන් ලැබියයුතුව තිබූ හිඟ බදුකුලී එකතුව රු. 138,165 ක් පසුගිය වර්ෂ 5 ක් තුලදී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්‍ය සාධනය

#### (අ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) කසල බැහැර කරන ස්ථානයන් සඳහා පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබුණි.

(ii) සෞඛ්‍ය කම්කරුවන් වාර්ෂික වෛද්‍ය පරීක්ෂවලට භාජනයකර නොතිබුණි.

(iii) අපද්‍රව්‍ය වර්ගීකරනය කර ලබා ගෙන නොතිබුණි.

(iv) සභාවේ කසල බැහැර කරන ස්ථානවලට ලැබෙන කසල වර්ගීකරණය කිරීමට වැඩ පිළිවෙලක් ආරම්භකර නොතිබුණි.

(v) අපද්‍රව්‍ය කළමනා කරණ පිළබඳ නිලධාරින්ට පුහුණු ලබාදී නොතිබුණි.

(vi) අපද්‍රව්‍ය කළමනාකරණයට අවශ්‍ය තොරතුරු සහ දත්ත ක්‍රමයක් පවත්වා නොතිබුණි.

(vii) ඝණ අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරනයෙන් තොරව පරිසරය දූෂණය වන ආකාරයට ගිණි තබා පුළුස්සනු ලැබේ.

**(ආ) ප්‍රමාදවූ ව්‍යාපෘති**

**------------------**

සභාව විසින් එකතුව රු. 710,510 ක් වටිනාකමට ඇස්තමෙන්තුකර සැපයුම් කරුවන් දෙදෙනෙකුට සමාලෝචිත වර්ෂයේදී ලබාදී තිබූ කොන්ත්‍රාත් වැඩ වෙනුවෙන් රු. 49,760 ක් ගෙවා තිබුණද, එම කාර්යයන් පසුගිය මාස අටේ සිට මාස දොලහක කාලයක්තුල අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි.

**3.2 වත්කම් කළමනාකරණය**

**----------------------------**

**3.2.1 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය**

**--------------------------------**

ඉකුත් වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව, ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ වශයෙන් හඳුනාගෙන තිබූ තොග භාණ්ඩ 503 ක් සම්බන්ධයෙන් 2009 නොවැම්බර් 13 දින හා අංක 438 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව කටයුතු කර නොතිබුණි.

**3.2.2 පවරා නොගත් වත්කම්**

**-------------------------**

සභාව වෙත පවරා නොතිබූ වාහන 06 ක් පසුගිය වර්ෂ 03 ක් තුල සභාව විසින් ප්‍රයෝජනයට ගෙන තිබූ බව නිරීක්ෂණය විය.

**4 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**---------------------------------------**

**4.1 අයවැය පාලනය**

**-------------------**

අයවැය ගත ආදායම සහ තථ්‍ය ආදායම් අතර අහිතකර රු. 4,377,873 සිට හිතකර රු. 378,122 ක් දක්වා නොහොත් සීයට 15.76 සිට සීයට 4.68 දක්වා විචලනයන්ද, ඇස්තමේන්තු ගත වියදම් සහ තථ්‍ය වියදම් අතර අහිතකර රු. 173,458 සිට හිතකර රු. 4,674,801 ක් දක්වා නොහොත් එය සීයට 5.12 සිට සීයට 16.42 දක්වා විචලනයන් නිරීක්ෂණය විය.

**5 පද්ධති හා පාලන**

**--------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩු |
|---|---|---|---|
| (අ) | වත්කම් / දේපල | (i) | ලේඛන ගත නොකිරීම. |
| | | (ii) | ආරක්ෂා කිරීමට කටයුතු නොකිරීම. |
| (ආ) | තොග | (i) | භාණ්ඩ, තොග ලේඛනයේ ඇතුලත් කර නොතිබීම. |
| | | (ii) | අනිසි තොග පාලනය. |
| (ඇ) | ව්‍යාපෘති / ගිවිසුම් | (i) | ගිවිසුම් වලට එළඹී නොතිබීම. |
| | | (ii) | ප්‍රමාණවත් අධීක්ෂණයක් නොවීම. |